# සිගරට්, අරක්කු, බියර් පිළිබදව ළමුන් තුළ ආකර්ශණයක් ගොඩනැංවීම අවම කිරීමේ උත්සාහය උදෙසා

● සිගරට්, අරක්කු, බියර් පිළිබදව ළමුන් තුළ ආකර්ශණයක් ගොඩනැංවීම සඳහා රූපවාහිනී වැඩසටහන් වන කාටූන් ,ටෙලිනාට්‍ය, චිත්‍රපටි යොදාගනීම දුම්කොළ හා මද්‍යසාර කර්මාන්ත විසින් සිදුකරන උපක්‍රමයකි.

● තවද දුම්කොළ හා මද්‍යසාර කර්මාන්ත කතාන්තර පොත්, විවිධ සෙල්ලම් භාණ්ඩ, අන්තර්ජාලය හා පුවත්පත් හරහා විවිධ උත්සව නිර්මාණය කරමින් අනුග්‍රහ දක්වමින් සහ අලංකාර ඇසුරුම් නිර්මාණය කරමින් සිගරට්, අරක්කු හා බියර් පිළිබදව ළමුන්තුළ ආකර්ශණය ගොඩනැංවීම සඳහා උත්සහ දරයි.



**රූපවාහිනී වැඩසටහන් වලින් සිගරට්, අරක්කු හා බියර් ප්‍රචාරණයක් දුටු මොහෙතේ දී දැක්විය හැකි ප්‍රතිචාර නම්,**

● ප්‍රචාරණය සිදුකරන අදාල මාධ්‍ය ආයතනයට හෝ එම දර්ශන රඟපාන පුද්ගලයන්ට කතා කර අප්‍රසාදය එලකිරීම. ඒ සදහා දුරකතන ඇමතුමක් හෝ තැපැල්පතක් යොදාගත හැක.

● සිගරට්, අරක්කු බියර් බිම ආකර්ශණීය ලෙස පෙන්වන නළු නිළියන්ට දුම්කොළ හා මද්‍යසාර සමාගම්වලින් මුදල් ලැබෙන බව දරුවන් හා පවුලේ අය සමග කතා කරන්න ඒ වගේම අවට අයගෙත් ඒ පිළිබද දැනුම වැඩිකරන්න

**සිගරට් ,මද්‍යසාර භාවිතයේ ගැටළුව ලෙස මතකයේ රදවාගත යුත්තේ කුමක්ද ?**



● සිගරට්,මද්‍යසාර භාවිතයේ ගැටළුව ලෙස ලෙඩරෝග සෑදෙන බව කුඩා දරුවන් වුවත් දන්නා කරුණකි. තවද එය දැනුමට පමණක් සීමාවේ. අනාගතයේදී දරුවන් සිගරට්, අරක්කු හා බියර් නොබොන අය බවට පත්කර ගැනීමට එම දැණුම ප්‍රතිඵල දායක නොවේ.

● ප්‍රතිඵල දායකවීමට නම් මද්‍යසාර භාවිතයේ ගැටළුව ලෙස මද්‍යසාර භාවිතය නිසා ඔවුන්ගේ මුණ කැතවෙනබව, වයසට වඩා වයස පෙනුමක් ඇතිවන බව, සතුට අඩුවන බව, මුදල් නැතිවනබව දරුවන්ට කියලාදීමට පුළුවනි. ඒ මෙන්ම මද්‍යසාර භාවිතයේ ගැටළුව ලෙස අපි ද මෙය මතකයේ රදවා ගනිමු.



● දුම්කොළ භාවිතය හෙවත් සිගරට් භාවිතයේ ගැටළුව ලෙස සිගරට් භාවිතය නිසා ඔවුන්ගේ මුණ කැතවෙනබව, තොල් කැතවෙනබව, ගඳගහනබව,වයසට වඩා කැත වයස පෙනුමක් ඇතිවෙනබව, සතුට අඩුවෙනබව, මුදල් නැතිවෙනබව දරුවන්ට කියාදෙමු. ඒ ලෙසම සිගරට් භාවිතයේ ගැටළුව ලෙස අපි ද මෙය මතකයේ රදවා ගනිමු.



## ළමා අයිතිවාසිකම්



- අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
- අම්මා සහ තාත්තා යන දෙදෙනාගේම ආදරය ලැබීමට ඇති අයිතිය
- නිරෝගීව සෞඛ්‍ය සම්පන්නව සිටීමට ඇති අයිතිය
- මත්ද්‍රව්‍ය වලින් නිදහස් පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය
- නිවැරදි තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය
- සතුටින් සිටීමට ඇති අයිතිය වැනි තව බොහෝ අයිතිවාසිකම් ළමයින්ට හිමිවිය යුතුව ඇත.

## මද්‍යසාර හා දුම්වැටි භාවිතය නිසා ළමයින්ට හිමිවිය යුතු අයිතීන් කඩවීමක් සිදුවන්නේ ද?

- වැඩිහිටි අයගේ මද්‍යසාර හා දුම්වැටි භාවිතය නිසා ඉහත සදහන් කර ඇති ළමයින්ට හිමිවිය යුතු අයිතීන් කඩවීමක් හෙවත් උල්ලංඝනය වීම් සිදුවනු ඇත.

## මද්‍යසාර හා දුම්වැටි කර්මාන්ත ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කරනවාද ?



- සිගරට්, අරක්කු හා බියර් වලට දරුවන් හසුකර ගැනීම සදහා උත්සාහ කිරීම.
- ළමුන් සදහා නිර්මාණය වන කාටූන් ,ළමා චිත්‍රපටි ,ළමා කතාන්තර පොත්, මද්‍යසාර හා දුම්වැටි වර්ගවල නාමයන් වර්ණයන් සහ හැඩයන් යොදා සෙල්ලම්භාණ්ඩ නිර්මාණය කිරීම හා ඒ ලෙසම ළමුන් සදහා ඇදුම් නිර්මාණය කිරීම.
- සිගරට්, අරක්කු ,බියර් භාවිතාකරන අවස්ථාවන් සහිත පරිසරයන් වැඩිපුර නිර්මාණය කිරීම.
- රූපවාහිනී වැඩසටහන් යොදාගනිමින් සිගරට්, අරක්කු, බියර් භාවිතයෙන් සිදුවනවා යැයි හුවා දක්වන වැරදි පණිවිඩ ප්‍රචාරය සිදුකිරීම.

## සිගරට්, අරක්කු, බියර් පිළිබදව ළමුන් තුළ ආකර්ශණයක් ගොඩනැංවීම අවම කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදුකිරීමේදි කළයුත්තේ කුමක්ද ?

- ළමුන් තුළ යම් දෙයක් පිළිබඳව ආකර්ශණයක් ගොඩනැංවුවොත් එය භාවිතයට ළමුන් යොමුවන බව පෙනෙණ කරුණකි.
- එසේ නම් අනාගතයේදී දරුවන් සිගරට්, අරක්කු, බියර් නොබෙන අය බවට පත්කරගැනීම නම් ඒවා පිළිබඳව ළමුන්තුළ ඇතිවිය හැකි ආකර්ශණය අඩුකිරීම සිදුකළ යුතුය.
- එම අරමුණ සපල කරගැනීමට නම්, සිගරට්, අරක්කු ,බියර් පිළිබඳව ආකර්ශණය අඩුකරවීමට හැකිවන අන්තර්ගතයන් සහිත ක්‍රියාකාරකම් සිදුකළ යුතුය.
- ප්‍රතිඵල දායක බවෙන් අඩු පාගමන් ,චිත්‍රතරග ,කථික, විවාද තරග වැනි දෑ නොකළයුතුයි.

